# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல் / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1068 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திக / Date – 27/06/2024 පැය 1630

## මාධ්‍ය නිවේදනය

**මත්ද්‍රව්‍ය විනාශ කිරීමේ අවස්ථාව ආවරණය කිරීමට මාධ්‍යවේදීන්ට ආරාධනා කිරීම.**

මත්ද්‍රව්‍ය ව්‍යසනයෙන් තොර සුරක්ෂිත දේශයක් නිර්මාණය කිරීමේ උදාරතර සංකල්පය මත ශ්‍රී ලංකා පොලීසිය, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය, පොලිස් විශේෂ කාර්ය බලකාය හා නාවික හමුදාව එක්ව විශාල වශයෙන් මත්ද්‍රව්‍ය වැටලීම් සිදු කරනු ලබයි.

**එසේ වැටලීම් සිදුකර අත්අඩංගුවට ගෙන අධිකරණ කටයුතු අවසන් වූ අයිස් මත්ද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 614 ග්‍රෑම් 36 ක ප්‍රමාණයක්, කෙටමින් මත්ද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 581 ග්‍රෑම් 34 ක ප්‍රමාණයක් හා හෙරොයින් කිලෝ ග්‍රෑම් 13 ග්‍රෑම් 686 ක ප්‍රමාණයක් 2024.06.29 වන දින වනාතවිල්ලුව ලැක්ටෝස් වත්ත පිහිටි අධිබලැති මත්ද්‍රව්‍ය විනාශ කිරීමේ උඳුනේ විනාශ කිරීමට කටයුතු සූදානම් කර ඇත.**

මෙම මත්ද්‍රව්‍ය තොගය 2024.06.29 වන දින උදෑසන 05.30 ට කොළඹ මහාධිකරණයේදී මත්ද්‍රව්‍ය කාර්යංශයේ නිලධාරීන් විසින් භාර ගැනීමට නියමිතය. එදින උදෑසන 09.30 ට වනාතවිල්ලුව පොලිස් වසමේ ලැක්ටෝස් වත්ත පිහිටි අධිබලැති මත්ද්‍රව්‍ය විනාශ කිරීමේ උඳුනේදී පුත්තලම ගරු මහේස්ත්‍රාත්තුමාගේ අධීක්ෂණය යටතේ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නියෝජිතයින්, රජයේ රස පරීක්ෂක හා මත්ද්‍රව්‍ය නිවාරණ කාර්යංශ නිලධාරීන්ගේ සහාය ඇතිව මෙම මත්ද්‍රව්‍ය තොගය විනාශ කිරීම විනිවිද බාවයකින් යුතුව සිදු කිරීමට කටයුතු කරන අතර එම අවස්ථාව ආවරණය කිරීම සඳහා ඔබ මාධ්‍ය ආයතනයේ ප්‍රාදේශීය මාධ්‍යවේදී මහත්ම මහත්මීන් සහභාගී කරවන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**